ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ශ්‍රී ලංකා රේගුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ශ්‍රී ලංකා රේගුවේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා රේගුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය

යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	විවිධ පාර්ශවයන් විසින් සිදුකරන ලද සෘජු බැංකුගත කිරීම් අදාලවන ආදායම් සංකේතයන් නිශ්චිතව හඳුනාගත නොහැකිවීම නිසා ආදායම් හඳුනා ගන්නා තෙක් තාවකාලිකව වාර්තා කර තැබීමට යොදාගත් ආදායම් පාලන ගිණුමේ වර්ෂ අවසාන දිනට වූ හර සහ බැර ශේෂයන් පිළිවෙලින් රු.18,785,730,933 ක් සහ රු.7,772,069,824 ක් නිවැරදිව හඳුනා නොගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයන් වශයෙන් හඳුනාගෙන තිබුණි. එම වටිනාකම් ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ නිශ්චිත ආදායම් සංකේතයන් යටතේ හඳුනා නොගෙන විවිධ ලැබීම් සහ විවිධ ගෙවීම් වශයෙන් දක්වා තිබුණි.	විගණන විමසුමෙහි ආදායම් පාලන ගිණුම ලෙස දක්වා ඇත්තේ රේගු මූල්‍ය පාලන ගිණුමවේ. එම පාලන ගිණුමේහි වර්ෂ අවසාන හර හා බැර ශේෂයන්ගෙන් මෙහෙයුම් ක්‍රියාකරකම් යටතේ ජනනය වූ මුදල් ප්‍රවාහයන් නිරූපනය වේ. එබැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ එය ඉදිරිපත් කර ඇත.	බැංකු තැන්පතු හඳුනා ගැනීම සඳහා නිශ්චිත ක්‍රම වේදයක් ස්ථාපිත කලයුතු අතර වර්ෂය තුල සිදු වී ඇති බැංකු තැන්පතු සියල්ල විශ්ලේෂණය කර ආදායම් හා වියදම් හඳුනාගැනීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශන පිළියල කලයුතුය.

(ii)	ඒසීඒ 1(i) හි දක්වා තිබුණු රේගු දෙපාර්තමේන්තුවට අදාල හිඟ අදායම් අනුව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු හෝ ගෙවිය යුතු ශේෂයක් නොමැති වුවද, ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ගිණුම් අනුව රේගුවට ගෙවිය යුතු මුදල රු.32,072,136,585 ක් සහ රේගුවෙන් ලැබිය යුතු මුදල රු.1,239,333,736 ක් වශයෙන් දක්වා තිබුණි.	රේගු දෙපාර්තමේන්තුවට අදාළ හිඟ ආදායම් සම්බන්ධ විස්තර ඒසීඒ 1(i) ආකෘති පත්‍රය යටතේ ඉදිරිපත් කර ඇත.	රේගු දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම්, හිඟ ආදායම් හා වර්ෂයට අදාල ආදායම් නිසි ලෙස හඳුනාගත හැකි වන පරිදි ගිණුම් ගත කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් ස්ථාපිත කල යුතුය.

(ආ) ආදායම් නොවන ලැබීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පරීක්ෂණ අවසන් වී ඇති රේගු විමර්ශනයන් 184 ට අදාලව විවිධ පාර්ශවයන්ට පැනවූ දණ්ඩන හා අභිමිකිරීම් (penalties and forfeitures) වටිනාකම වූ රු.4,790,470,462 ක් 2024 දෙසැම්බර් 31 දින වන විට ද අයකර ගෙන නොතිබීම නිසා රේගු ආඥා පනතේ 153 (2) (අ) වගන්තිය ප්‍රකාරව එකී දණ්ඩන හා අභිමිකිරීම්වලින් මහා භාණ්ඩාගාරයට ලැබිය යුතු සියයට 30 ක වටිනාකම වූ රු.1,437,141,139 ක් ද හිඟ හිටව පැවතුණි.	පරීක්ෂණ අවසන් වී ඇති රේගු විමර්ශනයන්ට අදාලව අයවීමට ඇති දණ්ඩන හා අභිමි කිරීම් අයකර ගැනීම සඳහා අදාල පාර්ශවයන් වෙත ලිඛිතව දන්වා යවා ඇති අතර ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර නොදක්වන ආයතන පිළිබඳ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.	පරීක්ෂණ අවසන් වී ඇති රේගු විමර්ශනයන් මඟින් පැනවූ දණ්ඩන හා අභිමිකිරීම්(penalties and forfeitures) අනුව අයකල යුතු වටිනාකම්, ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර ගෙවීම් අනුකූලතාවයක් නොමැති ශේෂයන් විෂයෙහි අප්‍රමාදව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නිලධාරීන් 10 දෙනෙකුට අදාලව අත්තිකාරම් "බී" ගිණුමේ දැක්වූ ණය ශේෂය සහ සාමාජික ණය ලේඛණයේ (සී.සී.10 ලේඛණය) දැක්වූ ණය ශේෂය අතර රු.426,574 ක නොසැසඳීමක් වූ අතර නිලධාරීන් 26 ට අදාලව අත්තිකාරම් "බී" ගිණුමේ දැක්වූ රු. 3,762,258 ක ණය ශේෂය සාමාජික ණය ලේඛණයේ (සී.සී.10 ලේඛණය) ඇතුළත්ව නොතිබුණි.	නිලධාරීන් 10 දෙනෙකුට අදාළව අත්තිකාරම් "බී" ගිණුමේ දක්වා තිබූ ශේෂ සහ සාමාජික ණය ලේඛනයට අනුව (CC 10 ලේඛනය) රු.426,574/- ක නොසැසඳීම පෙන්නුම් කරනු ලබන්නේ සාමාජික ණය ලේඛනවලට පිටපත් කිරීමේදී සිදුවී ඇති දෝෂයන් හේතුවෙනි.	අත්තිකාරම් "බී" ගිණුමේ දැක්වෙන ණය ශේෂයන් සමඟ සාමාජික ණය ලේඛණයේ දැක්වෙන ණය ශේෂයන් සැසඳෙන පරිදි විධිමත් හා පූර්ණ ගිණුම්ගත වීමක් සහතික වන ගිණුම් ක්‍රමයක් හා පාලන ක්‍රමයක් ස්ථාපිත කොට පවත්වාගෙන යා යුතුය.

(ඈ) ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රේගුවේ විවිධ අංශ 13 ක් මගින් සිදු කරනු ලබන විමර්ශන 216 ට අවශ්‍ය වියදම් දැරීම සඳහා අත්අඩංගුවට ගන්නා ලද සහ රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ අත්තිකාරම් ගිණුමෙන් (අ.රා.බ. ගිණුම) වසර 05 කට පෙර ලබාගෙන තිබුණු අත්තිකාරම් රු. 6,462,337 ක් විමර්ශන විසඳීම ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ද පියවා නොතිබුණි. ලබාගත් අත්තිකාරම් එම විමර්ශන අවසන් වූ පසුව කඩිනමින් පියවිය යුතු වුවද, අවස්ථා 11 කට ආදාළව එම ගිණුමෙන් ලබාගත් අත්තිකාරම් රු. 1,122,171 ක් විමර්ශන අවසන්වී තිබියදීත් පියවීමට කටයුතු කර නොතිබුණි.	අ.රා.බ ගිණුමෙන් ලබාගත් අත්තිකාරම් අදාල විමර්ශන අවසන් වන තෙක් පියවිය නොහැක. තවද, විමසුමෙහි දක්වා ඇති පරිදි 2024.12.31 දිනට දක්වා ඇති ශේෂය රු.6,462,337 ක් නොව රු.2,524,009.20 වේ. ඉදිරියේදී විමර්ශන අවසන් වූ පසු අත්තිකාරම් පියවීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	අත්තිකාරම් ලබා දීම සුවිශේෂී අවස්ථාවන්ට පමණක් සීමා කිරීමට හා විමර්ශනය අවසන් වුවත් නැතත් අත්තිකාරම් ලබාගත් කාර්යය අවසන් වූ වහාම කඩිනමින් අත්තිකාරම් පියවීමට අදාළ පටිපාටි ස්ථාපිත කල යුතුය.

(ඉ) දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.11,402,424,218 ක් වශයෙන් දැක්වුවද, ත්‍රිකුණාමලය සහ යාපනයේ පිහිටි ඉඩම් කැබලි 05 ක් සහ ඒවායේ පිහිටි ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම නිසා එම වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.	ත්‍රිකුණාමලය හා යාපනය පිහිටි ඉඩම් කැබලි 05 පවරා ගැනීම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා දැනටමත් කටයුතු සිදු කරමින් පවතින අතර පවරා ගැනීමේ කටයුතු අවසන් වූ පසු තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි හැකිතාක් දුරට සාධාරණ අගය ඇතුලත් කලයුතු බැවින් රේගුව සතු ඉඩම් හා ගොඩනැගිලි සියල්ල තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.

(ඊ) අග්‍රිම ශේෂය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඒසීඒ- 7 හි දැක්වූ අග්‍රිම ගැලපුම් ප්‍රකාශනයේ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම් සහ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම් පිළිවෙලින් රු.316,674,095 න් සහ රු.10,406,781න් අඩුවෙන් දක්වා තිබුණි.	ඒසීඒ-7 ට අනුව අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතන විසින් දරන ලද වියදම් ලෙස ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ සඳහන් අගය වන රු. 8,332,011,629/- දක්වා ඇත. අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුමේ බැර කිරීම් ලෙස රු. 26,754,157/- ක් ඒසීඒ-7 ආකෘතියේ දක්වා ඇති අතර එය ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව නිවැරදි වේ.	මූල්‍ය ප්‍රකාශනතුල නිවැරදි අගයන් ඇතුලත් වන බව සහතික වන ගිණුම් ක්‍රමයක් සකස් කල යුතුය.

(උ) මුදල් ප්‍රවාහයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ වැරදියට සටහන් වූ විවිධ ලැබීම් රු 2,047,737 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ලෙස සැලකිල්ලට ගැනීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් වැරදියට සටහන් කර තිබුණි.	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද ආනයනයන් වෙනුවෙන් වැය ශීර්ෂයන් පැවරීමේදී 2103 වැය ශීර්ෂයෙහි මූල්‍ය විෂය නිවැරදි කිරීම සඳහා ගිණුම්ගත කර ඇති ජ'නල් සටහන් මඟින් රු. 2,047,737 ක මුදල ඒකාබද්ධ ශේෂ පිරික්සුමට බැර වී ඇත. එබැවින් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ජනනය වූ මුදලක් ලෙස ගිණුම්ගත කර ඇත	මූල්‍ය ප්‍රකාශනතුල නිවැරදි අගයන් ඇතුලත් වන බව සහතික වන ගිණුම් ක්‍රමයක් සකස් කල යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (ආ) (iii)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.11,402,424,218 ක් වශයෙන් දැක්වුවද, ත්‍රිකුණාමලය සහ යාපනයේ පිහිටි ඉඩම් කැබලි 05 ක් සහ ඒවායේ පිහිටි ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම නිසා එම වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි	1.6.1 (ඉ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආදායම් සංකේත 4 ට අදාලව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය අදායම අතර සියයට 3 සිට සියයට 36 ක් දක්වා වූ පරාසයක ඌණ විචලනයක් හා ආදායම් සංකේත 7 ට අදාලව සියයට 21 සිට 447 ක අධි විචලනයක් ඇති වී තිබුණි.	රේගු දෙපාර්තමේන්තුවේ ආදායම එම වර්ෂයේ ආනයන හා අපනයන ප්‍රමාණයන් මත තිරණය වේ. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය ආදායම අතර මෙවැනි විචලනයන් ඇතිවිය හැක.	නිසි පුරෝකතනයකින් යුක්තව විචක්ෂණශීලීව ඇස්තමේන්තු සකස් කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයේ ආදායම් පූර්ව වර්ෂයේ ආදායම් සමඟ සැසඳීමේ දී ආදායම් සංකේතාංක 3කට අදාලව ආදායමෙහි සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණු අතර එය සියයට 10 සිට සියයට 75 ක් දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.	මෙම ආදායම් ඇස්තමේන්තු ලබා දෙනු ලබන ඉලක්ක වන අතර යම් යම් ආර්ථික වෙනස්වීම් මත එම ඉලක්කයන්හි විචලනයක් ඇතිවිය හැක.	ආදායම් වර්ධනය කළ හැකි ක්‍රමවේද පිළිබඳව අවධානය යොමුකළ යුතු බව.
(ඇ)	සමස්ථ හිඟ බදු ආදායමෙන් සියයට 38 ක් වූ රු. 22,044,131,527 ක ආනයන බදු ප්‍රමාණයෙන් සියයට 0.007 ක පමණ වූ රු. 1,500,438 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුල අයකර ගෙන තිබුණි.	නිරීක්ෂණය සමග එකඟ වේ.	රජයට ලැබිය යුතු ආදායම් ප්‍රමාදයකින් තොරව රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම.
(ඈ)	සමස්ථ හිඟ බදු ආදායමෙන් සියයට 26 ක් පමණ වූ රු. 15,236,676,819 ක් විශේෂ වෙළඳ භාණ්ඩ බදු වලින් නියෝජනය වන නමුත් පසු ගිය වසර 4ක කාලය තුල ඉන් කිසිදු මුදලක් අයකර ගැනීමට හැකි වී නොතිබුණි.	නිරීක්ෂණය සමග එකඟ වේ.	රජයට ලැබිය යුතු ආදායම් ප්‍රමාදයකින් තොරව රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඉ)	සමස්ථ හිඟ බදු ආදායමෙන් සියයට 17 ක් පමණ වූ රු. 9,943,802,984 ක් වරාය සහ ගුවන්තොටුපොල සංවර්ධන බදු ඇතුලත් වී ඇති අතර ඉන් සියයට 99.9 ක් වූ රු.9,945,317,734 ක් වසර 4කට පෙර සිට පැවතඑන හිඟ ආදායම් වන නමුත් ඉන් රු. 1,514,750 ක් පමණක් වර්ෂය තුල අයකර ගෙන තිබුණි.	නිරීක්ෂණය සමග එකඟ වේ.	රජයට ලැබිය යුතු ආදායම් ප්‍රමාදයකින් තොරව රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ ආදායම වූ රු. 58,478,974,134 ක ශේෂය විශ්ලේෂණය කිරීමේ දී වර්ෂය තුල අයකරගෙන තිබූ මුලු හිඟ ආදායම රු. 771,450,220 ක් වුයෙන් හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රමාණය සියයට 1.32 ක තරම් ඉතා සුළු ප්‍රතිශතයක් පමණක් විය.	නිරීක්ෂණය සමග එකඟ වේ.	රජයට ලැබිය යුතු ආදායම් ප්‍රමාදයකින් තොරව රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම.
(උ)	අංක 01/2015 සහ 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුව පිළයෙල කරන ලද හිඟ ආදායම් වාර්තාව අනුව ජනාධිපති කාර්යාලය ද ඇතුලුව රජයේ විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 37 කින් රු.57,721,517,615 ක් 2024 දෙසැම්බර් 31 දිනට රේගුවට අය විය යුතුව පැවති අතර මෙම සියලු හිඟ බදු 2020 වර්ෂයට පෙර සිට රේගුවට අය විය යුතුව පැවති ශේෂයන් වේ. මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව එම ආදායම් අත්හැර දැමීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් 2024 නොවැම්බර් 07 දින මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් අනුමැතිය ඉල්ලා තිබුණි.	විගණන විමසුමේ දක්වා ඇති අයකරගත නොහැකි හිඟ රේගු බදු ආදායම වන රු.57,721,517,615/- වර්ෂ 2020 හෝ ඊට පෙර මූල්‍ය වර්ෂයන් වෙනුවෙන් වාර්තා වී ඇත. මෙම මුදල නිරවුල් කරන්නනේ නම් ඒ ඒ රාජ්‍ය ආයතන විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කල යුතු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස රජයේ වියදම ඉහල යනු ඇත.	රජයට ලැබිය යුතු ආදායම් ප්‍රමාදයකින් තොරව රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

3.2 වියදම් කළමනාකරණය

3.2.1 පුනරාවර්තන වියදම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පුනරාවර්තන වැය විෂයයන් 13 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 6 සිට සියයට 100 ක් දක්වා ප්‍රතිශතයක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.	වැය විෂය 1101 සහ 1505 සඳහා ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු වී ඇත්තේ ඇස්තමේන්තු කල පරිදි වියදම් අවශ්‍යතා ඇති නොවීම හේතුවෙනි. 1102 වැය විෂය සඳහා රේගු නිලධාරීන්ගේ කළමනාකරණ වන්දි අරමුදල මගින් අදාල වියදම් දරා ඇත. වැය විෂය 1401 හි පුරෝකථනය කල පරිදි ප්‍රවාහන සේවා සැපයීම අවශ්‍ය නොවීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. රජය විසින් අපේක්ෂා කල පරිදි ණය ලබා නොදීම නිසා 1506 වැය විෂයෙහි ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	නිසි පුරෝකතනයකින් යුක්තව විචක්ෂණශීලීව ඇස්තමේන්තු සකස් කළ යුතුය.

3.2.2 මූලධන වියදම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නිසි ලෙස පුරෝකථනයන් සිදුකර වියදම් ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 25 සිට සියයට 66 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මේ නිසා ප්‍රතිපාදන අත්‍යාවශ්‍ය අංශ සඳහා මෙම ප්‍රතිපාදන උපයෝජනය කරගැනීමේ අවස්ථාව අහිමි වී ඇත.	මෘදුකාංග නඩත්තු අළුත්වැඩියා ලෙස ගිනුම්ගත කිරීම 1304 වැය විෂයෙහි ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වී ඇත.	නිසි පුරෝකතනයකින් යුක්තව විචක්ෂණශීලීව ඇස්තමේන්තු සකස් කළ යුතුය.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස	නිර්දේශය
	-------------	-------------------	-----------------	------------------
(i)	1869 අංක 17 දරන රේගු ආඥා පනත 84 (අ) (3) වගන්තිය	බන්ධිත ගුදමකදී එකලස් කෙරෙන වාහන සඳහා දේශීයව සියයට 30 ට නොඅඩු අගයක් එකතු වන්නේ නම් කර්මාන්ත අමාත්‍යවරයාගේ නිර්දේශ මත සියයට 70ක නිෂ්පාදන බදු සහනයක් ලබා දිය හැකිය. සමාලෝචිත වර්ෂයේ තුළදී එවැනි සමාගම් 7 ක් විසින් කර්මාන්ත අමාත්‍යවරයාගේ නිර්දේශ මත ලබා දෙන සියයට 70ක නිෂ්පාදන බදු සහනය ඉල්ලා තිබුණි. එහෙත් රේගුව විසින් රේගු ආඥා පනතේ ප්‍රතිපාදන අනුව පිරිවැය ගණනය කිරීම හා ඊට අදාල සියයට 30ක දේශීය අගය එකතු කිරීම් නිවැරදිව සලකා බැලීමකින් තොරව බදු සහනය ලබා දීමට කටයුතු කර තිබුණි. 2024 වර්ෂයේදී බන්ධිත ගුදම්හිමි නිෂ්පාදන සමාගම් 7ක් විසින් මෝටර් කාර් 538 ක් සහ යතුරු පැදි 53,381	විගණනය හා එකඟ වේ. මේ දක්වා නිතිපති උපදෙස් ලැබී නැත	රේගු ආඥාපනතේ විධිවිධානයන්ට හා කර්මාන්ත අමාත්‍යවරයාගේ නිර්දේශයන්ට අනුකූලව නිවැරදිව නිෂ්පාදන බදු ගණනය කල යුතුය.

		ක් ගුදමේ එකළස් කර දේශීය වෙළඳපලට නිකුත් කර තිබුණි. විගණනය විසින් සිදුකල ගණනය කිරීම් අනුව එම වාහන සඳහා අයවිය යුතු නිෂ්පාදන බද්ද රු.10,744,332,600 ක් වියයුතු වුවත් රේගුව විසින් රු.3,356,784,548 ක් පමණක් අයකර තිබීම හේතුවෙන් රු.7,387,548,052 ක නිෂ්පාදන බදු ආදායමක් අහිමි වී තිබුණි.		
(ii)	1869 අංක 17 දරන රේගු ආඥා පනත 153 (2) (ආ) වගන්තිය	ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවත්, ඊට අනුකූල නොවන සේ සකස් කර ඇති 1988 ජනවාරි 28 දිනැති අංක පීඑල්118 දරන දෙපාර්තමේන්තු නියෝගය අනුව 2012 වසරේ සිට 2024 වර්ෂය දක්වා වූ වර්ෂ 13 ක් තුළ ත්‍යාග අරමුදලෙන් නිලධාරීන් වෙත රු.25,244,792,239 ක හා ඔත්තුකරුවන් වෙත රු.4,554,073,737 ක මුදලක් බෙදා හැර තිබුණි.	සෑම වර්ෂයකම ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කර මුදල් අමාත්‍යවරයාගේ පෞද්ගලික අනුමැතිය ලබාගෙන අදාල මුදල් ගෙවා ඇත	රේගු ආඥාපනතේ අදාල වගන්තිය අනුව මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන සුදුසු නීත්‍යානුකූල ක්‍රමවේදයක් සකස් කල යුතුය.
(iii)	162 වගන්තිය	රේගු භාරයට ගැනීමෙන් පසු නශ්‍යවන භාණ්ඩ වර්ග හැකි ඉක්මනින් විකුණා දැමිය යුතු වුවත් 2024 දෙසැම්බර් 31 දින වන විට විවිධ හේතු මත රේගුවේ විවිධ අංගනවල රඳවා ඇති බහාලුම් 867 ක් තුල පවතින භාණ්ඩ, මිනිස් පරිභෝජනයට ගත හැකිවන පරිදි යොමුගත වගන්තියට ප්‍රකාරව බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි.	162 වගන්තිය අනුව කටයුතු කර අපහරණය සඳහා මධ්‍යම අපහරණ අංශය වෙත යොමු කර ඇති බහාලුම් සංඛ්‍යාව 2024 දෙසැම්බර් 31 දා වන විට 252 ක් පමණ වේ. ඉන් බහාලුම් 75 ක් ටෙන්ඩර් මඟින් විකිණීම සඳහා ඉදිරිපත් කර ඇති අතර තවත් 28 ක් නඩු කටයුතු පැවරීම හේතුවෙන් රඳවා ගෙන ඇත. බහාලුම් 149 ක ප්‍රමාණයක් සම්බන්ධයෙන් පමණක් විනාශ කිරීමේ ක්‍රියාවලිය මධ්‍යම අපහරණ අංශය මගින් සිදු කරමින් පවතී.	නශ්‍යවන භාණ්ඩ සම්බන්ධ රේගු නිවාරණ ක්‍රියාවලිය කඩිනම් කිරීමේ හා එකී ක්‍රියාවලියෙන් අනතුරුව උක්ත භාණ්ඩ ඉවත් කිරීමට නිසි ක්‍රමවේදයක් සකස් කල යුතුය.
(iv)	ආයතන සංග්‍රහය XXIVපරිච් ඡේදයේ 4:6 උප වගන්තිය	මිය ගිය නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු ණය ශේෂ ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට නියමිතව ඇති ඕනෑම මුදලකින් අඩුකර ගත යුතු අතර ඇපකරුගෙන් හා උරුමක්කාරයින්ගෙන් අයකර ගත නොහැකි නම් අප්‍රමාදව නීතිපති උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වුවත්, වර්ෂ10 සිට 20 දක්වා කාලය ගත වූ එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 119,700 ක ශේෂයක්, වර්ෂ 5 සිට 10 දක්වා කාලය ගත වූ නිලධාරීන් 2දෙනෙකුගෙන් අයවිය යුතු රු. 96,990 ක ශේෂයක් හා වර්ෂ 5 දක්වා කාලය ගත වූ නිලධාරීන් 6 දෙනෙකු ගෙන් අයවිය යුතුරු. 1,045,748ක ශේෂයක් ලෙස මිය ගිය නිලධාරීන් 9 දෙනෙකු ගෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට අයවිය යුතු රු. 1,262,438 ක ණය ශේෂ සම්බන්ධයෙන් උක්ත	මියගිය නිලධාරීන් 9 කගෙන් අයවිය යුතු රු. 1,262,438 ක ණය ශේෂයට අදාලව පැහැදිලි කිරීම් ඇමුණුම් අංක 02 මඟින් ඉදිරිපත් කර ඇත.	ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කල යුතුය.

		විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි		
(v)	මු.රෙ. 102 සහ 110	විදේශිය පුද්ගලික ආයතනයක් විසින් නැවකින් නැවකට භාණ්ඩ මාරු කිරිමේ ක්‍රමය යටතේ (Transshipment) සිංගප්පූරුවෙන් නැව්ගත කරනු ලැබූ දුම්වැටි තොගයකට අදාළව සිදු කරන ලද රේගු විමර්ශනයන්හි ප්‍රතිඵලයක් ලෙස දුම්වැටි තොගය රාජසන්තක කර පසුව රු.5,901,750 කට වෙන්දේසි කර තිබුණි. එහෙත් උක්ත රාජසන්තක කිරීමට එරෙහිව ආනයනකරු පැවරූ නඩුවෙන් රේගුව වැරදිකරු වී රු.69,451,809 ක වන්දියක් ආනයනකරු වෙත ගෙවීමට සිදු වී තිබුණි. ඉහත වැරදි තීරණයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව 2023 මැයි 11 දින මූලික විමර්ශන කමිටුවක් පත්කර තිබූ අතර එහි වාර්තාව මාස දෙකක් ඇතුළත ඉදිරිපත් කළ යුතුව ඇතත් 2025 අප්‍රේල් 20 දින වන විටත් උක්ත වාර්තාව ඉදිරිපත් කර වැරදි තීරණයට වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.	මූලික විමර්ශන කමිටුව විසින් අවසන් වාර්තාව ලබා දීඇති අතර ඒ අනුව මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතයි.	ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුව මූලික විමර්ශන කඩිනම්ව අවසන් කර විධිමත් විනය ක්‍රියාමාර්ග ගෙන රජයට සිදු වූ පාඩුව අදාල නිළධාරින් වෙත අධිභාර කල යුතුය.
(vi)	මු.රෙ. 570/571	තැන්පත් කල දින සිට වර්ෂ 02ක් තුළ හිමිකම් නොපෑ සියලුම තැන්පතු, ඉකුත් තැන්පතු ලෙස සළකා මු.රෙ 571(3) ජේදයෙහි විධිවිධාන අනුව රාජ්‍ය ආදායමට බැර කළ යුතුවුවත් සමාලෝචිත වර්ෂාවසානය වන විට වර්ෂ 2 ඉක්ම වූ රු.13,620,000 ක ටෙන්ඩර් තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරිමට කටයුතු කර නොතිබුණි.	අවුරුදු දෙක ඉක්ම වූ තැන්පතු රජයේ ආදායමට බැර කිරීම සිදු කරනු ලබන්නේ වර්ෂ දෙක සම්පූර්ණ වූ පසු ඊලඟ වර්ෂයේදීය .2024 වර්ෂයේදී රජයේ ආදායමට බැර කරන ලද්දේ වර්ෂයේ 2021, වසර දෙක ඉක්ම වූ තැන්පතුය. ඒ අනුව 2022 වර්ෂයේ වසර දෙක ඉක්ම වූ තැන්පතු රජයේ ආදායමට යැවීම වර්ෂයේ සිදු කරනු 2025 ලබයි.කෙසේ නමුත් විගණනය විසින් දන්වා ඇති ආකාරයට වසර දෙක ඉක්ම වූ තැන්පතු රජයේ ආදායමට බැරකිරීම සඳහා සටහන් කර ගතිමි.	මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කල යුතුය

(vii)	2024.01.24 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම් නිර්දේශය හා 2017අප්‍රේල්19 දිනැති අංක 3/2017 දරන චක්‍රලේඛය.	සියලු රාජ්‍ය සේවකයන් සිය පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතු වුවත්, ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2335 දෙනෙකු සඳහා වැටුප්, වේතන, අතිකාල, නිවාඩු දින වැටුප් හා දිරිදීමනා වශයෙන් රු.2,308,694,777 ක් සහ රේගු අතිකාල නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදල මගින් අතිකාල දීමනා ලෙස රු.1,087,172,344 ලෙස එකතුව රු.3,395,867,121 ක් ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම සහතිකකර ගැනීමකින් තොරව 2024 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. එසේම පැමිණීම් සහ පිටවීම් පිළිබඳ නිසි සනාථ කිරීමකින් තොරව මෙම සේවකයන් සඳහා දිනකට පැය 24 ක් දක්වා අතිකාල දීමනා ගෙවීම් කර තිබුණි.	රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සේවයේ ස්වභාවය අනුව පැමිණීම හා පිටවීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත කිරීම ප්‍රායෝගික නොවන බව නිරීක්ෂණය කරමි. ඒ හේතුවෙන් ,නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා රේගු දෙපාර්තමේන්තුවේ සියළුම අංශවල මාණ්ඩලික නිලධාරීන්ගේ සමීප අධීක්ෂණය යටතේ පොදු ආකෘති 18පත්‍රය භාවිතා කිරීමට කටයුතු කර ඇති බව සඳහන් කරමි.	චක්‍රලේඛ විධිවිධානයන්ට අනුගත විය යුතු බව.

3.4 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සුදු සීනි ලෙස අනාවරණය කර දුඹුරු සීනි ආනයනය කිරීම නිසා දණ්ඩනයන්ට ලක් වූ ආනයනකරුවෙකුට රේගුව විසින් රු.500,000 ක දඩයක් සහ රු.189,293,778 ක අභිමි කිරීමක් පනවා තිබූ අතර ආනයනකරු එකී දණ්ඩනයට එකඟවීම මත රාජසන්තක නොකර රු.190,000,000 ක බැංකු ඇපකරයක් මත භාණ්ඩ තොගය රේගු භාරයෙන් නිදහස් කරගෙන තිබුණි. ආනයනකරු විසින් එකී දණ්ඩනය සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබූ අතර අමාත්‍යවරයා විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ නමුත් පනවන ලද දණ්ඩන මුදලින් රු.මි.30ක් අඩු කිරීමට අමාත්‍යවරයා තීරණය කළ බවට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් පසුව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දී ඇතත් අමාත්‍යවරයා ලබාදුන් එවැනි අනුමැතියක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි. මෙම ලිහිල් කිරීම නිසා රජයට සිදුව තිබූ සමස්ත රාජ්‍ය ආදායම අහිමි වීම රු.62,505,801ක් වූ අතර මෙම ආනයනකරු මීට පෙර අවස්ථා 23 ක දී දණ්ඩනයන්ට ලක්වී තිබුණි.	අහිමි කිරීමේ ප්‍රමාණය රු. 189,293,778/- ක සිට රු. 160,000,000/- ක් දක්වා අඩු කිරීම ගරු මුදල් අමාත්‍යවරයා විසින් ගන්නා ලද නෛතික තීරණයකට අනුව සිදුකරන ලද්දක් බව නිරීක්ෂණය වී ඇත. වෙළඳ හා අයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ හා මුදල් ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලිපි ශීර්ෂයෙන් යුක්තව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් යොමු කල මුදල් අමාත්‍යවරයාගේ විධානය පිළිබඳ දැනුම්දීම පිළිගෙන රේගුව කටයුතු කර ඇත.	දණ්ඩනයක් ලිහිල් කිරීමේදී රේගු ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව.
(ii)	ස්වර්ණාභරණ ආනයනය සහ අලෙවිය සිදු කරන ප්‍රසිද්ධ සමාගමක් විසින් රු.753,210,479 ක් වටිනා රන් ආභරණ විදේශයන්ගෙන් ගෙන්වාගෙන ආනයන බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් අංක PCAD/2024/00043/CCR/00171 යටතේ රේගු විමර්ශනයක් සිදු කර තිබුණි. එම සමාගම විසින් රේගුවට ගෙවිය යුතු බදු මුදල රු.219,817,086 ක් වූ අතර රේගු ආඥා පනතේ 107 සහ 129 වගන්ති ප්‍රකාරව මෙම භාණ්ඩ රාජ	ගොනුව ලද වහාම පිළිතුරු ඉදිරිපත් කරනු ලැබේ.	රේගු අඥා පනතට අනුකූලව අයකල යුතු බදු මුදලට නොඅඩු දණ්ඩනයක් පැනවීම

	සන්තක කර සහ භාණ්ඩ වටිනාකම මෙන් තෙගුණයක අභිමිකිරීමක් සිදු කළ හැකි වුවත්, විමර්ශන අවසානයේ රු.2,919,082,695 ක අභිමි කිරීමක් අනුව පසුව එය රු.190,000,000 ක් දක්වා ලිහිල් කර තිබුණි. මෙම ලිහිල් කිරීම හේතුවෙන් ගෙවිය යුතුව තිබූ බදු මුදලට වඩා රු.29,817,086 ක් අඩුවෙන් ගෙවා භාණ්ඩ නිදහස් කර ගැනීමට ආනයනයකරුට හැකිවී තිබුණි.		මහින් නීති විරෝධී ක්‍රියා සඳහා යොමුවීම පාලනය කරගත යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දැක්ම හා මෙහෙවර

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනවශ්‍ය ආදායම් කාන්දුවීම්(Revenue Leakages) වැළැක්වීමේ එක් උපක්‍රමයක් වශයෙන් 2024 වර්ෂය සඳහා වූ අයවැය යෝජනා මඟින් "රේගුව තුළ අවදානම් කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම" සඳහා රු. මිලියන 100 ක් වෙන් කර ඇතත් වර්ෂය අවසාන වන විටත් ලංසුකරුවෙක් තෝරාගැනීම හැර ඊට අදාල කාර්යයන් සිදුකර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු හා එකඟ වෙමි. පළමු තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම පවත්වා වාර්තාව 2024 මාර්තු 31 සකස් කර ඇති අතර තාක්ෂණික ඇගයීම් කමිටුවට බාහිරින් සාමාජිකයින් දෙදෙනෙකු පත් කර ගැනීමට යෝජනා කරන ලදි. ඒ් සඳහා ගත වූ කාලය මාස 02කි. ඉන් පසු කොළඹ විශ්ව විශ්ව විද්‍යාලයට ලිපියක් මඟින් තාක්ෂණික ඇගයීම් කමිටුවට සුදුසු පුද්ගලයෙකු නම් කරන ලෙස 2024 මැයි 31 දින දන්වා පිළිතුරු නොලද හෙයින් 2024 ජුලි 31 දින වෙනත් පුද්ගලයෙකු තෝරා ගැනීමට උපදෙස් පතමින් සටහනක් ගොනුවේ ඇතුලත් කරන ලදි.	අයවැය මඟින් වෙන් කර ඇති ප්‍රතිපාදන අදාල වර්ෂයේදි උපයෝජනය කර යෝජිත කාර්යයන් අප්‍රමාදව ඉටුකල යුතුය.
(ආ)	භාණ්ඩවල මිල ඌන තක්සේරු කර (Under Value) භාණ්ඩ ආනයනය කර ඒ බව අනාවරණය වූ අවස්ථාවකදී නියම ලෙස ගෙවිය යුතු ඉතිරි බදු මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර වෙන බව අධ්‍යක්ෂ ජනරාල් විසින් 2024 මැයි 09 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දී ප්‍රකාශ කර ඇතත්, ඌන තක්සේරු කළ අවස්ථා ද රේගු විමර්ශන බවට පත් කර දණ්ඩන පනවා ඉන් සියයට 50ක් ත්‍යාග වශයෙන් නිලධාරීන් ලබා ගෙන තිබුණි. රේගු විමර්ශනවලින් පසු "භාණ්ඩ ඌන තක්සේරු කිරීම්" කර ඇති බවට හෙළිදරව් වූ අවස්ථා 1858 කදී විමර්ශනයෙන් පසු අභිමිකිරීම් සහ දණ්ඩන පනවා ඉන් සියයට 30 ක් පමණක් රාජ්‍ය ආදායමට බැර කර තිබුණි.	ශ්‍රී ලංකා රේගුව, භාණ්ඩවල වටිනාකම තක්සේරු කිරීමේදී රේගු ආඥා පනතේ "E"උපලේඛනයට අනුව හා 52 වන වගන්තියට අනුව දෙයාකාරයකට කටයුතු කරයි.	ගිණුම් පිළිබඳ කාරක සභාවේ දී ප්‍රකාශ කර ඇති පරිදි භාණ්ඩවල මිල ඌන තක්සේරු කර (Under Value) භාණ්ඩ ආනයනය කර ඇති අවස්ථාවකදී නියම ලෙස ගෙවිය යුතු ඉතිරි බදු මුදල් අයකර ගත යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අලෙවි කළ නොහැකිභාණ්ඩ විනාශ කිරීමේ කාර්යයේ වගකීම දරන මධ්‍යම අපහරණ අංශය වෙත භාණ්ඩ විනාශ කිරීම් සඳහා ඉල්ලීම් 128 ක් ඉදිරිපත් වී ඇතත්, ඉන් ඉල්ලීම් 33කට අදාළව පමණක් භාණ්ඩ විනාශ කිරීමට කටයුතු කර තිබුණි.	විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. මේ සඳහා අංශයේ පැවති නිලධාරි හිඟයද බලපා ඇත. මේවන විට අදාල අපහරණ කටයුතු ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.	අලෙවි කළ නොහැකිභාණ්ඩ විනාශ කිරීමේ කාර්යයන් ප්‍රමාදයකින්තොරව සිදු කල යුතුය.
(ආ)	ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීම (Build Own & Operate- BOO) යන ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ රැපිස් ස්කෑන් සිස්ටම් ප්‍රයිවට් ලිමිටඩ් නමැති සමාගමෙන් රේගුව සිය බහාළුම් පරිලෝකන කටයුතු සිදුකර ගෙන තිබුණු අතර 2021 වර්ෂයේදී එම සමාගමටම ඇ.ඩො. 21,590,008 ක් ගෙවා පද්ධතියේ පූර්ණ අයිතිය රේගුවට ලබා ගැනීමට කටයුතු කර තිබුණි. මෙහිදී රේගු නිශ්කාෂණ ක්‍රියාවලිය සඳහා පූර්ණ එක්ස්රේ පරිලෝකනයක් අපේක්ෂා කර තිබුණ ද එය ක්‍රියාත්මක නොවීම නිසා ප්‍රකාශිත භාණ්ඩ අයිතමයන් අතර සඟවා ඇති අයිතමයන් හඳුනා ගැනීම, ව්‍යාජ භාණ්ඩ ප්‍රකාශ කිරීම් සංඛ්‍යාව අඩු කිරීම, තහනම් හා නීතිවිරෝධි භාණ්ඩ ආනයනය අවම කිරීම යන අපේක්ෂිත සැලසුම්වලට ලඟාවීමට නොහැකි වී තිබුණි.	මෙම පද්ධතියේ පවතින තාක්ෂණික ගැටලු සොයා බැලීමට එම සමාගමේ නිලධාරින් සමඟ සාකච්ඡා පවත්වා ඇති අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය යෝජනා හා නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කර ඇත.	රේගු වැරදි හඳුනාගැනීම සහ වැළැක්වීම සඳහා නවීන තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතා කළ යුතුය.

4.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රේගුව විසින් අල්ලා ගන්නා ලද ද්‍රව්‍යයන් අපහරණය කරන එක් ක්‍රමවේදයක් ලෙස ටෙන්ඩර් ක්‍රමය භාවිතා කලද, වාර ගණනාවක් ටෙන්ඩර් අලෙවියට ඉදිරිපත් කළ නමුත් නිසි මිලක් ඉදිරිපත් නොවීම හේතුවෙන් ග්‍රේ ලයින් I, ග්‍රේ ලයින් II සහ ඒෂියන් බහාලුම් අංගනයේ පමණක් පිළිවෙලින් භාවිතා කරන ලද ඇඳුම්, වාහන අමතර කොටස් සහ මෙට්ට සහිත බහාලුම් 55 ක් අලෙවිකරගත නොහැකිව රඳවා තිබුණි.	2024 දෙසැම්බර් මසදී දිගු කලක් තිස්සේ නොවිකිණි ඉතිරි වී තිබු භාණ්ඩ නැවත පරීක්ෂා කර අදාල භාණ්ඩවලට වර්තමාන තත්ත්වය පාදක කර ගෙන නැවත තක්සේරු කිරීමට විශේෂ කමිටුවක් පත්කරන ලද අතර එමගින් දිගු කලක් තිස්සේ නොවිකිණී තිබුණ භාණ්ඩ විශාල ප්‍රමාණයක් විකුණා දැමීමට හැකි විය.	රේගු අපහරණයන් පිළිබඳව පුළුල් ප්‍රචාරයක් ලබා දීමට පියවර ගත යුතුය.

4.4 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රේගුව සතුව කාර්, වෑන්, කැබ් ආදී වශයෙන් වර්ග 06 ක වාහන 110 ක් පවතින නමුත් ඉන් වාහන 25 ක් ධාවන තත්ත්වයේ නොතිබුණි. ඉන් සමහර වාහන මාස 29 ක කාලයක් ධාවනයේ යොදවා නොතිබුණි. 2025 මාර්තු 20 දින විගණනය විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව වාහන 20 ක් කිසිදු ආවරණයක් රහිතව වරාය පරිශ්‍රයේ නවතා දමා තිබුණු අතර සැපයුම් හා සේවා අංශය විසින් සිදු කරන ලද තහවුරු කිරීමට අනුව එම වාහන දින 14 ක සිට අවුරුදු 12 ක් දක්වා කාලයක් එම ස්ථානයේ උපයෝජනයකින් තොරව ගාල්කර තිබුණි. ඉන් බහුතර වාහන සංඛ්‍යාවක් අලුත්වැඩියා කළයුතු තත්ත්වයේ පැවතුණ ද, එයට අවශ්‍ය කටයුතු කඩිනම්ව සිදු වී නොතිබුණි.	මේ සම්බන්ධව පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.	වත්කම් උපරිම ඵලදායීතාවයෙන් සහ කාර්යාක්ෂමතාවය කින් යුක්තව උපයෝජනය කළ යුතුය.

4.5 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නිවාරණ කාර්යයන්හිදි බැංකු ඇපකර මත ආනයනික භාණ්ඩ නිදහස් කල අවස්ථා 27ක දී ඇපකරය වලංගු කාලය තුල පරීක්ෂණ අවසන් කිරීමට හෝ පරීක්ෂණ කාලය හා සමගාමීව බැංකු ඇපකර වලංගු කාලය දීර්ඝ කර නොගැනීම හේතුවෙන් එලෙස රු.100,172,482 ක බැංකු ඇපකර මත නිදහස් කල භාණ්ඩ සම්බන්ධයෙන් අයකල යුතු දණ්ඩන හා අහිමි කිරීම් අයකර ගැනීම අභියෝගාත්මකවී තිබුණි. සමාලෝචිත වර්ෂාවසාන දිනට උක්ත පරීක්ෂණ ආරම්භකර වසර 1 ½ සිට වසර 12ක් දක්වා කාලය ගත වී ඇතත් පරීක්ෂණ අවසන් කිරීමට හෝ පරීක්ෂණ අවසන් කරන තෙක් බැංකු ඇපකර වලංගුව තබා නොගත් නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතුකර නොතිබුණි.	ඉහත සඳහන් බැංකු ඇපකරවල කල් ඉකුත්වීමේ දිනයන් හා අනෙකුත් අදාළ තොරතුරු ඇතුළත් කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ASYCUDA පද්ධතිය මගින් සකස් කරන ලද වැඩසටහන් භාවිතා කරන ලද අතර, එම වැඩසටහනෙහි පෙර පැවති Reminder Option මෙම විගණන විමසුම මගින් නිර්දේශිත කාල සීමාව තුළ අක්‍රියව තිබූ බව පසුව දැන ගැනීමට ලැබුණු බවත්, ඒ බව දැනගත් විගස දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට දන්වන ලද බවත්, සඳහන් කරමි.	කාලය ඉකුත් වූ සහ ව්‍යාජ බැංකු ඇපකර හඳුනා ගැනිමට නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කල යුතු බව.

4.6 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රේගුව විසින් දිගු කාලයක් රඳවා ගෙන ඇති බහාලුම් අතර වාහන අමතර කොටස් සහිත බහාලුම් 60 ක්, ප්ලාස්ටික් ද්‍රව්‍ය සහිත බහාලුම් 57 ක්, ලී බඩු සහ දැව සහිත බහාලුම් 36 ක්, ආහාර ද්‍රව්‍ය බහාලුම් 301 ක්, දුම්වැටි සහ දුම්වැටි සහිත දැ ඇතුළත් බහාලුම් 24 ක්, පුවක් බහාලුම් 34 ක් සහ විවිධ මිශ්‍ර අයිතම් සහිත බහාලුම් 49 ක් විය. ආහාර ද්‍රව්‍ය සහිත බහාලුම් අතර වියළි මිරිස් අඩංගු බහාලුම් 20 ක්, අර්තාපල් බහාලුම් 11 ක්, පාන්පිටි නිෂ්පාදන 9 ක්, හාල් බහාලුම් 107 ක් සහ තේ බහාලුම් 54 ක් ද වූ අතර, ඉක්මනින් නශ්‍ය වන භාණ්ඩ සම්බන්ධයෙන් කඩිනම්ව කටයුතු කර නොතිබුණි.	රේගු දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය සඳහා හඳුන්වා දී ඇති දින120 යාවලිය යටතේ කඩිනම් අපහරණ ක්‍රි දීර්ඝ කාලයක් තිස්සේ රඳවා පවතින ව්‍යබහාලුම් වල, විකිණිය හැකි ද්‍ර විකිණීමටත් විනාශ කළ හැකි විනාශ කිරිමටත් කටයුතු වයාද්‍ර තිසිදුකරමින් පවයි.	රඳවා ගෙන ඇති බහාලුම් සම්බන්ධ යෙන් කඩිනම්ව කටයුතු කළ යුතු බව.

(ආ)	මාසිකව රු.4,650,000ක කුලී මුදලක් ගෙවමින් රේගුව විසින් මට්ටක්කුලිය ප්‍රදේශයේ පෞද්ගලික සමාගමකින් ලබා ගෙන තිබුණු ඉඩමක අත් අඩංගුවට ගන්නා ලද වාහන 332 ක් හා රුහුණු මාගම් පුර වරාය භූමියේ වාහන 108 ක් රඳවා තිබුණි. මින් බහුතර වාහන සංඛ්‍යාවක් දිගු කාලයක් අංගනවල ගාල් කර තැබීම හේතුවෙන් දිරාපත් වී ධාවනයට නුසුදුසු තත්ත්වයට පත් වී තිබුණි. කෙසේවුවද, රේගු ආඥා පනතේ 109 වගන්තිය ප්‍රකාරව දින 30ට වැඩි කාලයක් රේගු භූමියේ තිබෙන්නට හරින බඩු ප්‍රසිද්ධ දැන්වීමකින් පසු වෙන්දේසියේ හෝ ටෙන්ඩර් මඟින් විකුණා දැමීමට හැකියාව පැවතියදී මෙම තත්ත්වය ඇති වී තිබුණු අතර මට්ටක්කුලිය ප්‍රදේශයේ පෞද්ගලික සමාගමට පමණක් වර්ෂය තුළ රු.55,800,000ක කුලියක් ගෙවා තිබුණි.	මෙම වාහන අතරින් ඇතැම් වාහන සඳහා රේගු විමර්ශන තවදුරටත් ක්‍රියාත්මකව පැවතීම, අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබීම, වරාය ගාස්තු ගෙවීම ප්‍රමාදවීම වැනි හේතු මත බැහැර කිරීම ප්‍රමාද වී ඇත. තවද රේගු ආඥා පනතේ 109 වගන්තිය යටතේ රජයේ කටයුතු සඳහා නිදහස් කිරීම සඳහා නියමිතව ඇති වාහන 11 ක් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් විමසා ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	අත්අඩංගුව ට ගන්නා ලද වාහන රේගු පනත ප්‍රකාරව කඩිනමින් අපහරණය කළ යුතුය.

4.7 **කළමනාකරණ දුර්වලතා**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මධ්‍යගත සිද්ධි ලේඛනයට (Central Case Register) අනුව 2015 සිට 2024 දක්වා සිද්ධි 37,685 ක්ලියාපදිංචි කර තිබුණු අතර, ඉන් සිද්ධි 28,166 ක් විසඳා අවසන්ව හා සිද්ධි 9,519ක් තවදුරටත් විසඳීමට ඉතිරිව පැවතුණි. ඊට වසරක් ඇතුලත ලියාපදිංචි කරන ලද සිද්ධි 1,523 ක්, වසර 1 ට වැඩි වසර 5 ට අඩු සිද්ධි 4,958 ක් හා වසර 5 ට වැඩි සිද්ධි 3,038 ක් ඊට ඇතුලත් වී තිබුණි.	විමර්ශන විසඳීම කල්ගතවීමට විවිධ හේතු පවතී.	විමර්ශන කඩිනම්ව අවසන් කිරීමට කටයුතු කළයුතුය.
(ආ)	Sea Trans තීරු බදු රහිත සාප්පු සංකීර්ණයෙන් නීති විරෝධි දුම්වැටි කාටුන් 45 ක් (කාටුනයක සිගරට් 200 ක් ඇත) රැගෙන යාම සම්බන්ධව ප්‍රධාන රේගු පරීක්ෂක සහ රේගු නියාමක නිලධාරීන්ට අදාලව සිදු කළ මූලික පරීක්ෂණයේ වාර්තාව අනුව ඔවුන් දෙදෙනාට චෝදනා පත්‍ර භාර දී වසරක් ගත වී තිබුණි. කෙසේවුවද, රේගු අධ්‍යක්ෂ (නිවාරණ) විසින් චූදිත රේගු නියාමකවරයාට විධිමත්ව එම චෝදනා පත්‍රය භාර දී නොමැති බව පසුව හෙළිදරව් වූ අතර ආයතන සංග්‍රහයේ පළමුවන උපලේඛණයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදු කළ හැකි වරදවල් හි 15 වන වගන්තිය යටතට ගැනෙන "ආයතන සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය කිරීම හෝ හිතාමතා හෝ අනවධානයෙන් හෝ නොසලකා හැරීම හෝ මඟහැරී යන ආකාරයෙන් කටයුතු කිරීමක්" සේ සැලකිල්ලට ගෙන උක්ත රේගු අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. 2020.10.19 දින භාර දෙන ලද චෝදනා පත්‍රය අනුව ඉහත රේගු නිලධාරීන් දෙදෙනා ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය අනුව රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධ "පළමු වන උපලේඛනය" යටතට ගැනෙන වැරදි සිදු කර ඇතත්, එය "දෙවන උපලේඛනයට ගැනෙන වැරදි" ලෙස සාවද්‍ය වර්ගීකරණයක් සිදු කර තිබුණි. නිකුත් කරන ලද චෝදනා පත්‍රයේ අඩුපාඩු හඳුනා ගැනීමෙන් පසු 2023.11.29 දින සංශෝධනය කරන ලද චෝදනා පත්‍රයක් මෙම නිලධාරීන් දෙදෙනාට ලබා දී විධිමත් විනය පරීක්ෂණ සිදු කිරීම සඳහා ඒක පුද්ගල විනිශ්චය සභාවක් පත්කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විටත් පරීක්ෂණ	විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. කොළඹ වරාය පරිශ්‍රය තුළ පිහිටි සී.ට්‍රාන්ස් තීරුබදු රහිත සාප්පුවෙන් නීති විරෝධී දුම්වැටි පිට කිරීම සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයේ චූදිතව සිටි එච්.එස්.විජිතවීර මහතා වෙත 2025.01.30 දිනැතිව විනය නියෝග ලබා දී විධිමත් විනය පරීක්ෂණ කටයුතු අවසන් කර ඇත. උක්ත සිදුවීමට සම්බන්ධ අනෙක් අනෙක් චූදිත වන ඩී.එම්.ඒ.එස්.හේරත් මහතාගේ විනය පරීක්ෂණය ඒක පුද්ගල විනිශ්චය සභාව ලෙස කටයුතු කරනු ලබන එච්.එල්.තිසේරා මහතා විසින් තවදුරටත් සිදු කරන බව ද වාර්තා කරමි. විධිමත් විනය පරීක්ෂණ සම්බන්ධයෙන් පරීක්ෂණ විනිශ්චය සභාව වෙත සිහිකැඳවීමේ ලිපි යැවීම හා දුරකථන ඇමතුම් මගින් ප්‍රගතිය විමසා බැලීම සිදු කිරීම මගින් පරීක්ෂණ කඩිනම් කිරීමට පියවර ගෙන ඇති බවද වාර්තා කරමි	නිලධාරීන් සම්බන්ධව විනයානුකූල ක්‍රියාමාර්ග අපක්ෂපාතිව ප්‍රමාදයකින් තොරව සිදු කල යුතුය.

	අවසන් වී නොතිබුණි.		
(ඇ)	රේගු විමර්ශන හේතුවෙන් විවිධ අංගනවල රඳවා තබා ඇති ස්ථානය හඳුනාගත නොහැකි බහාලුම් 80 ක් , රඳවා ගැනීමට හේතුව පැහැදිලි කළ නොහැකි බහාලුම් 29 ක් , රඳවා ගත් කාලය සොයාගත නොහැකි බහාලුම් 08 ක් හා අඩංගු ද්‍රව්‍ය හඳුනා නොගත් බහාලුම් 61 ක් විමර්ශනයන්ගෙන් තොරව රඳවාගෙන තිබුණි.	මෙම බහාලුම් සම්බන්ධ ගැටළු නිරාකරණයකරන ලෙස අදාල අංශවලට දැන්වීමට කටයුතු කර ඇත.	රඳවා ගෙන ඇති බහාලුම් පිළිබඳව යාවත්කාලීන නිවැරදි තොරතුරු පද්ධතියක් පවත්වාගත යුතු බව.
(ඈ)	සහකාර රේගු අධිකාරිවරයෙක් විසින් 2020 වර්ෂයේ දී සිදු කරන ලද මුදල් වංචාවක් සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කර තිබුණු අතර අදාළ වංචාව පිළිබඳ දෙපාර්තමේන්තු පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබීම පිළිබඳව විගණනය විසින් සිදුකරන ලද විමසීමෙන් පසුව මූලික විමර්ශන කමිටුවක් පත් කිරීමට කටයුතු කර තිබුණි. අදාල විමර්ශනයන් සඳහා පැමිණිලිකරු ඉදිරිපත් වී නොතිබු අතර පරීක්ෂණ ඒකපාර්ශවීය අවසන් කර ආයතන සංග්‍රහය අනුව කටයුතු කර නොතිබුණි.	අදාළ තොරතුරු දැනට ගෙන්වා ගෙන ඇති අතර ඒ අනුව අංක ESD/04/2022/02 ගොනුවෙන් මූලික විමර්ශනයක් අරඹා දැනට පැවැත්වෙමින් ඇත. එම මූලික විමර්ශනයේ පැමිණිලි පාර්ශවය වන එම්.එම්.ඉස්මි මහතාට මූලික විමර්ශන සඳහා ප්‍රකාශයක් ලබාදීම සඳහා පැමිණෙන ලෙස 2025.02.05 හා 2025.02.27 දිනැති ලිපි මගින් දන්වා යැවුවද ඔහු සඳහා පැමිණ නැත. විමර්ශන කටයුතු තවදුරටත් සිදුවෙමින් පවතී.	නිලධාරීන්ගේ වංචා සහ වැරදි සම්බන්ධයෙන් කළමනාකරණයේ වැඩි දුර අවධානය යොමු කල යුතු බව.
(ඉ)	මගීන් කැටුව නොයන භාණ්ඩ (Unaccompanied Passenger Cargo-UPB) පරීක්ෂණ මධ්‍යස්ථානවල රාජසන්තක කරන ලද සහ අත්හැර දමන ලද භාණ්ඩවිශාල වශයෙන් ගොඩගසා තිබීම නිසා එම මධ්‍යස්ථානවල ඉඩකඩ ඇහිරී තිබු නමුත් අප්‍රමාදව භාවිතා කළ හැකි භාණ්ඩ අලෙවියට /නොහැකි භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	අදාල පරීක්ෂණ මධ්‍යස්ථාන වලින් විකිණීම සඳහා මධ්‍යම අපහරණඅංශයට යොමු කර ඇති භාණ්ඩ නොපමාව ටෙන්ඩරයට ඇතුලත්කර ඇත. එමෙන්ම අදාල පරීක්ෂණ මධ්‍යස්ථාන වලින් විනාශ කිරිම සඳහා මධ්‍යම අපහරණ අංශයට යොමු කර ඇති භාණ්ඩ, විනාශ කිරීමේ ක්‍රියාවලියට ඇතුලත් කර ඇත.	රාජසන්තක කරන ලද සහ අත්හැර දමන ලද භාණ්ඩ සම්බන්දයෙන් ප්‍රමාදයකින් තොරව කටයුතු කල යුතුය.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙක් සමඟ සංවර්ධන නිලධාරීවරයෙක් සහ කළමනාකරණ සහකාරවරු 12ක් පමණ අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව ඇතත්, බහුතරයක් කළමනාකරණ සහකාරවරුන් සෑම මාස 06ට වරක් රේගුවේම විවිධ අංශයන්ට ස්ථාන මාරු කිරීම හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරය ඉටු කිරීමට නොහැකි තත්වයක් උද්ගත වී ඇති අතර එහි ස්වාධිනත්වය අභියෝගයට ලක් වී තිබුණි.	2023 හා 2024 වර්ෂයන්හි රේගු දෙපාර්තමේන්තුවේ ඉතිහාසගත ආදායම් ඉලක්ක සපුරාගෙන ඇත්තේ පවත්නා ස්ථාන මාරු ක්‍රමවේදය යටතේය. රේගු දෙපාර්තමේන්තුවේ සුවිශේෂි තත්ත්වයන් සලකා බැලීමේදී එක් ස්ථානයක දීර්ඝ කාලයක් රඳවා තැබීම ද ගැටලුකාරි තත්ත්වයක් ඇති කළහැකි බැවින්, පැවති ක්‍රමවේදය යටතේම අදාල ස්ථාන මාරු ප්‍රතිපත්තිය පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.	විධිමත් අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රමවේදයක් සකස් කළ යුතු බව.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව විසින් අස්ථිත්වයක අරමුණු ළඟා කර ගැනීමේ පරමාර්ථයෙන් සම්පත් සකසුරුවම් ලෙස සහ කාර්යක්ෂමව භාවිතා කරන බවට සමාලෝචනය කළ යුතු වුවත්, මුදල් අමාත්‍යාංශයේ හා රේගු දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුවේ වසර 5 ට වඩා සාකච්ඡාවට භාජණය කරන ලද ඉහත අරමුණුවලට සෘජු දායකත්වයක් ඇති කරුණු තවදුරටත් නොවිසඳී පැවතීම නිසා මෙම කමිටු පැවැත්වීමෙන් ලබා ගතහැකි ප්‍රතිඵල ලඟා කර ගැනීමට අසමත් වී තිබුණි.	මෙම කරුණු පිළිබඳව විධිමත්ව පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට සටහන් කර ගතිමි.	විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක විය යුතු බව.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ සිටින විවිධ සේවාවන්ට අයත් නිලධාරීන් බහුතරයක් දෙනා සෑම මාස 06 කට වරක් විවිධ අංශ / ඒකක / ශාඛා අතර ස්ථාන මාරු කිරීම හේතුවෙන් විවිධ විෂයන්ට අදාල රාජකාරි නිරන්තරයෙන් අද්දැකීම් නොමැති නිලධාරීන් වෙතින් ඉටුකරගැනීමට සිදු වීම, ලිපි ගොනු නිසි ලෙස භාර නොදීම, ලේඛණ අස්ථානගතවීම් හා ලිපි ගොනු යාවත්කාලීන නොවීම හේතුවෙන් අංශවල අභ්‍යන්තර පාලනයන් නිසි ලෙස ඉටු කිරීමට හා වගකීම සහ වගවීම තහවුරු කිරීමට නොහැකි වී ඇත.	රේගු දෙපාර්තමේන්තුවේ සුවිශේෂී තත්ත්වයන් සලකා බැලීමේදී එක්ස්ථානයක දීර්ඝ කාලයක් රඳවා තැබීම ගැටලුකාරී තත්ත්වයක් ඇති කළහැකි බැවින් පවත්නා ස්ථාන මාරු ක්‍රමවේදය ක්‍රියාත්මක කර ඇති අතර ඉදිරියේ පැනනඟින අවශ්‍යතා අනුව සුදුසු සංශෝධනය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.	විධිමත් අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රමවේදයක් සකස් කළ යුතුය.